නැහැ...”

ඈ නැවතවරක් නිහඬවම සිනාසුනේය. අවස්ථාවට උචිත නොවන මගේ අදහස් ගැන මම නැවත වරක් ලැජ්ජාවට පත් වුණෙමි.
“මට සමාවෙන්න ටාන්‍යා... මගේ අදහස් හැම-දෙයක් ම එක වගේ වැදගත් කියල හිතන්න අවශ්‍ය නැහැ... මම එහෙම දෙයක් කලින් හිතල තිබුණෙ නැහැ... ඔයා දැන් මගෙ ජැකට් එක ඇඳන් ඉන්නව දැක්කහමයි මට එහෙම හිතුනෙ...”
ඇගේ සිනහව තවත් වැඩි විය. සිනහව මැදින් ඈ කතා කරන්නට විය.
“නෑ ලහිරු... ඔයාගෙ අදහස් හැමදෙයක් ම මට එක වගේ වැදගත්... ඒ අදහස්වල තියන වැදගත්කමට හේතුවත් ඔයා ඔය දැන් කියන කාරණයමයි...”
“ඒ කිව්වෙ...?”

***ඔයාගෙ හිතටත් ඒ මට දැනුන විදිහෙ සංවේදී කමක් ඇතුළු උනොත්, ඒක මම ඔයාට කරන ලොකු අසාධාරණයක් කියල. අන්න ඒ නිසා ආයෙ කවදාවත් ඔයාව මුණ නොගැහෙන්න මම තීරණය කලා ලහිරු..***

“ඔයාගෙ අදහස්වල ඔයාට වාසිවන පැත්ත විතරක් එළියට දාන්න හිතාගෙන ඒ අදහස්වල කොටසක් ඔයා හංගගන්න හදන්නෙ නැහැ...” මම නිහඬව ම සිනාසුනෙමි. මගේ ඒ ගතිය දියුණු කරගත යුතුවූ අනුවණකමක් ලෙසට මම මේ වන විටත් තේරුම් කරගෙන සිටියෙමි. ටාන්‍යාම නැවතත් කතාව ඇරඹුවා ය.

“ලහිරු...”
“ඇයි..?”
“මේ ජැකට් එක ඔයාට ආපහු නොදුන්නෙ මට අමතක වීමක් නිසා නෙමෙයි...”
“එහෙනම් මොකක් නිසා ද?...”
“එදා ඒ දවසට... ඒ ගතකරපු හැම විනාඩියකට ම... මම ආස කළා ලහිරු...”
“ඇයි ඒ..?”
“මම දන්නෙ නැහැ. ඒ දවසෙ මට විස්තර කරන්න බැරි සුන්දරත්වයක් තිබුණා... ඒ මතකයට මම හැමදාම ආස කළා... ඔයාට මතක ද... පහුව දා උදේ ම නිහඬව ම ඔයා පිටත් වෙලා ගියා...”

“ඒත් ඔයා දැක්කනෙ මම පිටත්වෙලා යනව...”

“ඔව් ලහිරු... මට එදා හිතුන මගේ ජීවිතේ සතුට, මට අත දික්කරල ලබා ගන්න තරම් බැරි දුකක තියන දෙයක් කියල.. කලින් දවසෙ රෑ මට හරි නින්දක් තිබුණොත් නැහැ... නින්ද යාගෙන එන හැම වෙලාවක ම මම නෙයෙකුත් විකාර හීන දැක්ක... පහුව දා උදේ ඔයා මට අතවනල පිටත්වෙලා ගියහම මම තීරණය කරගත්ත... ආයෙ කවදාවත් ඔයාව මුණගැහෙන්න අවස්ථාවක් මම සකස් කරගන්නෙ නැහැ කියල...”

මම එදා ඒ ගතකල රාත්‍රියේත්, ටාන්‍යා මේ කරන විස්තරයත් අතර කෙතරම් සමාන කමක් වේ දැයි මට පුදුම සිතිනි. ඒ ජැකට්ටුව මත ගසා තිබෙන සුදු පාට රෝස මල මට පෙනේ... මගේ සිත තවතවත් ඈත අතීතයේ දින කරා ගමන් කරයි. ඒ හැම අතීත දවසක ම අසම්මතවූ මතකයන් තුළ අප දෙදෙනා ම දැන් අත්විඳින්නේ සුන්දරත්වයක් නොවේ දැයි සිත කියයි...

“ඇයි ඔයා කතා කරන්නෙ නැත්තෙ ලහිරු...?”

දුම්රිය කඩින් කඩ නැවතෙමින් නමුත් ඉදිරියට ම යයි. මම ජනේලයෙන් පිටත බැලුවෙමි. වේගයෙන් මා පසුකරමින් යන දර්ශන සියල්ලම සිතට අපූර්ව නැවුම් බරවක් එක් කරයි. මේ දවස, මේ මොහොත, මා බලාපොරොත්තු නොවූ අයුරින් මා කරා පැමිණ ඇත. මගේ සිතිවිලි දියඹේ සතුට පුරවාගත් ඔරුකඳක් දියත් වෙමින් පවතිනවා මට පෙනේ....

මා ආදරය කරන යුවතිය මින් ඉදිරියට සදහට ම මා සමඟ වනවාය යන හැඟීම පමණක් මා සිතේ නොසන්සිඳෙන ප්‍රීතියක් මතුකර දී තිබිණි. මගේ ජීවිතයේ වාසනාවත්, සතුටත් ඈ වෙත වන බව මම දනිමි. ප්‍රාර්ථනා බිඳී ගිය, හදවත පෑරී ගිය ඒ කටුක අතීතය වාසනාවන්ත අනාගතයක් වෙතට යන මඟ අපට පැහැදිලි කරදෙනු ඇත.
“ලහිරු... මම කතා කරපු දේවල් ඔයා අහගෙන ද හිටියෙ...”

“හැම දෙයක් ම ටාන්‍යා...” මම නැවත වරක් ඒ දෑස දෙසට හැරුනෙමි.
“එහෙනම් ඒ ගැන මුකුත් කියන් නැත්තෙ ඇයි..,?”

“මේ සුදු රෝස මලත් ඒ මතකයේ ම කොටසක් ද?”
ඈ ඊට පිළිතුරු වශයෙන් කිසිවක් කියන්නට ගියේ නැත. නමුත් ප්‍රීතිමත් සුන්දර සිනහවකින් ඒ මුව සැරසී තිබිණි. ඇගේ ජීවිතයට ඒ හඳුන්වා දීම කරන ලද්දේ මා විසින් බව මම දනිමි.

“එදා උදේ.. මීදුම මැද්දෙන් මම ඔයාව දැක්කෙ හරියට හිම ගොඩක් මැද්දෙ පිපිල තිබුණ සුදු රෝස මලක් වගෙයි...”
ඇය සිනාසෙමින් මා දෙස බැලුවා මිස කිසිවක් ම කීවේ නැත.

“ටාන්‍ය... එදා එතනදි ඇයි ඔයා තීරණය කළේ ආයෙ කවදාවත් මාව මුණගැහෙන්න අවස්ථාවක් සකස් කරගන්නෙ නැහැයි කියල...”

“ලහිරු...., මා වෙනුවෙන්... එදා ඒ දවස ඔයා වෙන් කලේ, මගේ සතුට වෙනුවෙන් ඔයා ඒ හැම දෙයක්ම කලේ, මගෙන් කිසිම දෙයක් ආපස්සට ලැබෙයි කියල හිතාගෙන නෙමෙයි.... ඔයා ගැන එදා මගේ හිතට ඇතිවෙච්ච ඒ ප්‍රසාදය කොයිතරම පුළුල් ගැඹුරු එකක්ද කියල මට විස්තර කරන්න අමාරුයි ලහිරු... මට ඒ දැනුන සංවේදී බව මට දරාගෙන ඉන්න බැරි තරම් දෙයක්... ඒක එක පැත්තකින් මට වේදනාවක් උනා. ඒ එක්කම මට හිතුන..., නොකඩවා ඔයාව මුණගැහුනොත්, ඔයාගෙ හිතටත් ඒ මට දැනුන විදිහෙ සංවේදී කමක් ඇතුළු උනොත්, ඒක මම ඔයාට කරන ලොකු අසාධාරණයක් කියල. අන්න ඒ නිසා ආයෙ කවදාවත් ඔයාව මුණ නොගැහෙන්න මම තීරණය කලා ලහිරු...”

“දැනුත් ඔයාට හිතෙන්නෙ එහෙම ද ටාන්‍යා...?”
“නැහැ ලහිරු...”
“එහෙනම්...?”
“අද ඉඳල ඒ හැම සංවේදී මොහොතක් ම මගේ ජීවිතෙට අයිතියක් ඇති දෙයක් වෙනව...”
ඒ අයිතිය දැන් ඈට පමණක් නොව මට ද උරුම ඇත්තකි.

“ලහිරු...”
“ඇයි ටාන්‍යා...?”
“ඔයාට අමතක වුණා ද... ඔයාව මම මේ ගමන එක්කගෙන ආවෙ ඇයි කියල අහන්න...?”
“ඔයා කියනකම් මම බලාගෙන ඉන්නෙ ටාන්‍යා...”
“එහෙනම් මාව ආයෙත් වලක්වන්න හදන්න එපා...”

ඈ නිහඬව ම සාක්කුවට අත යවා කුඩා පෙට්ටියක් එළියට ගත්තේ ය. මගේ හදවත වේගයෙන් ස්පන්දනය වන බවක් මට දැනුනි. මගේ දෑස දෙසට නිහඬව ම එබී බලමින් එය ඈ විසින් ම විවෘත කරන ලදී. කුඩා පියකරු මුදුවක් ඒ තුළ විය. එය මුදුවක් බව පෙට්ටිය විවෘත කිරීමටත් පෙර ම මම අනුමාන කළෙමි.

“ලහිරු... ඔයා කැමැති ද මේ මුදුව මගේ ඇඟිල්ලට දාන්න.. ඔයා කැමැති ද.. මාව විවාහ කරගන්න ලහිරු...”

ඒ මුදුව මතින් මම ඒ දෑස දෙස බලා උන්නෙමි.... වචනවලට පෙරලිය නොහැකි වන ආදරයකින් පිරී ගිය අවංක හදවතක සටහන් මගේ දෑස තුළ ඇය කියවමින් සිටින බව උතුරා යන ප්‍රීතියකින් පිරී ගිය ඒ දෙනෙත් මට පෙන්වා දුන්නේය.

**නිමි**

සිත් අවකාශයේ පෙලගැසුනු චරිත කිහිපයකට පණදීමෙන් මම සතුටක් ලදිමි. සන්නස තුලින් නැවත වරක් ඔබ සමඟ එය කියවීමෙන් ඒ සතුට අලුත් කර ගතිමි. හොඳ හෝ නරක ලෙසට මේ පිළිබඳව ඔබගේ විවේචනය දැනගැනීමට ඉතා කැමැත්තෙන් සිටිමි. පළමු නවකතාව එකම නවකතාව විය යුතුද යන තීරණයට එළඹීමට එය මට පහසුවක් වනු ඇත.
මගේ ලිපිනය: No. 38, Macfarland Crescent, Chifley, ACT. 2606
Email: vidyanim@yahoo.com.au
විද්‍යානි මනතුංග




# ගී සඳළුව

සිසිර දිසානායක

## මද්දුමයා



''සිනා පොදක් වී''... ''කලකට ඉහත සිය මධුර, කෝමළ හඬින් මතු නොව රුවින්ද රූපවාහිනී තිරය එකලු කළ දැරියක සිහියට නැංවිණා. ඕ දිගු ගවොමකින් සැරසී උන්නාය. සිය වතට හා වයසට ගැලපෙන සේ සැකසුණ කෙහෙරැල්ලෙන් යුත් හිස මදක් ඇළ කර සිනා මුවින් සිය ගායනය කළ ඇය දීපිකා ප්‍රියදර්ශනී පීරිස් නම් වූවාය.
සංගීතාචාර්ය ආනන්ද විජේසිරි ශිල්පියාණන් සමඟින් ''ආජු තපර ලායිලා'' පළමු ගැයුමෙන් ම රසිකයින් දිනූ ඇය විශාරද නන්දා මාලනියගෙන් මියැසියෙහි පන්නරය ලබා සංගීතවේදී රෝහණ වීරසිංහයන්ගේ සර මහිමයෙන් දොරට වැඩියාය. ''සන්නස'' වෙනුවෙන් ඇය අමතන්ටන අංකනය කළෙමි ඇයගේ දුරකතනය.

''කොහොමද ඉතින් සිසිර? කාලයකින් ,'' ඇය දිගු පිළිසඳරකට මුල පිරුවාය. ආ ගිය තොරතුරු අතරෙහි බොහෝ වේලාවක් රැඳීමෙන් අනතුරුව ''ගී සඳලුව'' වෙතට යොමු වූයේ. ''අපි ඉතින් ''මද්දේගම් ගිය මද්දුමයා'' ගැන ම ලියමුකෝ? එක්වනම යෝජනා කළාය. ඕ මා මදක් පසුබෑවේ තමන්ගේම පද රචනයක් පිළිබඳව කතිකාවතක යෙදීම සුදුසුදැයි මා තුළම වූ කුකුස නිසාවෙනි.

''ඔය අදහසට මම නම් එකඟ නෑ සිසිර ♪ යමක් රසිකයාට දුන්නාට පස්සේ තමන්ගෙකමින් අපි මිදෙන්න ඕන. ඒක රසිකයාගෙයි දැන්. ඒ ගීතය රසිකයින් ආදරයෙන් භාර ගත්තා. කාලයක් නිතර ප්‍රචාරය වුණ සින්දුවක්. අදටත් ඒ ගැන කතාවෙන සින්දුවක්. ඒ නිසයි ඒ ගැන ලියමු කියලා මං කිව්වේ. එහෙම නොවුනානම් ඒ ගැන කතා කරලාත් පලක් නෑ නේද?'' ඇය හා යුද වදින්නට මම අපොහොසත් විමි.

''මම හිතෙනවා අපි කලාකරුවන් වෙන්න හිතනවා නම් අපේ සංස්කෘතිය පිළිබඳව අධ්‍යනයක් කරන්නම ඕන කියලා. ජනප්‍රිය සංස්කෘතියේ ප්‍රධාන ධාරාවන් දෙකක් තියෙනවා. පළවෙනි එක තමයි ජනයා මතින් නැගෙන සංස්කෘතිය. අනික ජනයා ප්‍රියකරන සංස්කෘතිය. කලාකරුවන් ආ යුත්තේ ජනයා මතින්. ඒ කියන්නේ ජනයා පරිහරණය කරන කියන කරන දේ පාදක කරගෙන. ''මැද්දේ ගම් ගිය මද්දුමයා'' ගීයට ජනශ්‍රැතිය ප්‍රබල විදියට යොදාගෙන තියෙනවා. එයින් සාකච්ඡා වෙන්නේත් ප්‍රබල, ඒවාගේම අද අපේ සමාජයේ සුලභ අත්දැකීමක්. ගමෙන් නගරයට සංක්‍රමණය වූ සෑම දෙයක්ම වාගේ සුළුවෙන් හරි සංවේදී කරවන අත්දැකීමක්. ජන බස්-වහර යොදාගෙන පද රචනය වුණා වගේම රෝහණ අයියා අතින් තනුව යෙදුනේත් ජන සංගීත ආරකට. බටහිර සංගීත මෙවලම් යොදා ගත්තත් උද්දීපනය කෙරුණේ අර වචනයෙන්, තනුවෙන් කියවෙන දේමයි. නගරයට ගිය මලනුවන් කෙනෙක් ගැන අක්කණ්ඩියක් නගන නෝක්කඩුවකුයි මේ. තනුවටත් සංගීතයටත් ආරූඪ වෙලා මට මේ පද රචනාව ගායනා කරන්න වුණේ පරළ වෙලා වගේ. ඒක මගේ ඇඟට දැනුනා. බලන්න මයිකල් ජැක්සන්. ගෝත්‍රික රංගනයක් අරගෙනයි එයා ලෝකයට ආවේ. ඇයි අපට ඒ දේ කරන්න බැරි?'' තමන්ට වැඩියෙන්ම දැනෙන්නෙ තමන්ගෙම දෙයක් නේද?

දීපිකා නොනැවතීම ඇයගේ අදහස් ප්‍රකාශ කරගෙන ගියාය. සංගීත විශාරදවරියක ලෙස ලැබූ ශිල්පීය ඥානයත්, ප්‍රවීණ ගායිකාවක ලෙස ලැබූ නිසඳ අභ්‍යාසයත්, සංගීතාචාර්යවරියක ලෙස ලැබු පන්නරයත් මතු නොව මෑතකදී හදාරා නිම කළ මාධ්‍යවේදී ඩිප්ලෝමා උපාධියෙන් ලද පරිචයත් ඇයව සෑම අතින්ම පෝෂණය කර ඇති සේ දැණින.

''ඇත්තටම සිසිර මේ සින්දුවට තනුව දානකොට මමත් හිටිය රෝහණ අයියා ළඟ'' දීපිකා ''රෝහණ අයියා'' නමින් හඳුන්වන්නේ ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහයන්ව. ''තනුව දමන්න ගියේ විනාඩි පහකටත් අඩු වෙලාවක්.''

32 පිටට




# සංක්‍රමණිකයකුගේ සටහන

### දයා මාස්ටර්

දයා මාස්ටර් කොළඹට ගෙන ඒම මහින්දගේ වැඩක් නොව ඉන්දියානු ව්‍යාප්තවාදයේ නව ප්‍රවේශයක කොටසක් ලෙස දැනෙන්නේ කීදෙනෙකුටද? ඉන්දියාවත් සමඟ මේ ප්‍රශ්නය සහජීවනයෙන් විසඳා ගැනීමට තිබූ කාලය දැන අවසන් වෙමින් පවතිනවා. දැන් ප්‍රශ්නය විසඳෙන්නේ අපට නොව ඉන්දියාවට අවශ්‍ය ලෙසයි. ඊට අවශ්‍ය පරිසරය මේ ඉන්දියානු බුවල්ලා විසින් ක්‍රමයෙන් ගොඩ නගමින් සිටිනවා. සංස්කෘතිමය වශයෙන් කලාව හරහාද නිදහස් වෙළෙඳ ගිවිසුම් හරහා අපේ ආර්ථිකයද? තෙල් ඒකාධිකාරය හරහා අපේ නිෂ්පාදන බෙදාහැරීම්ද ක්‍රමයෙන් මේ බුවල්ලාගේ අඩු වල ග්‍රහණයට අසුවෙමින් තිබෙනවා. ඉන්දියාව වෙනම රාජ්‍යයකට ඉඩක් දෙන්නේත් නැහැ. එල්.ටී.ටී.ඊ. සමූල ඝාතනයට ඉඩදෙන්නෙත් නැහැ. අපිව ක්‍රමයෙන් ගෙන යමින් තිබෙන්නේ ඉන්දියාවට පාලනය කළ හැකි ඉන්දියානු මොඩලයේ බෙදාවෙන් කිරීමක් දක්වාද? පසුබිමින් සිදුවන මේ ක්‍රියාදාමයන් අතරතුර දයා මාස්ටර් වැන්නන් උදෙසා කෑමොරදීම නිෂ්ඵල දෙයක්, ප්‍රභාකරන්ට ඔහු තවත් ජීවිතයක් පමණයි. “මව්බිම නැතිනම් මරණය” කොයිතරම් හැඟීම් බර සටන් පාඨයක්ද? ඒත් අපි මේ මොහොතේ වැඩකළ යුත්තේ හැඟීමෙන් නොව දැනීමෙනුයි. ලෝකය දැන් පිවිසෙමින් තිබෙන්නේ අළුත්ම අවධියකටයි. ශක්තිය හා බලය විසින් සියල්ල පාලනය කරන තත්ත්වයකට නැවතත් යන ලකුණුද මේ.

### මානෙල් මල්

මල් හා සම්බන්ධ ව්‍යාපාර ලංකා ඉතිහාසයේ කීපතැනකම සඳහන් වෙලා තිබෙනවා අපට මතකයි. දෙවන ලෝක සංග්‍රාමය කාලේ සුද්දන්ට ආධාර පිණිස ඇති වූ පොපිමල් ව්‍යාපාරය ඊට එරෙහිව ලංකාවේ පරණ වමේ ව්‍යාපාරය කීර්තිමත්ව පැවති යුගයේ ඇති වුන සුරියමල් ව්‍යාපාරය. මෑත කාලයේදී පෙඩරල් ක්‍රමය වෙනුවෙන් තවලමේ කඩේ ගිය සුදු නෙළුම් ව්‍යාපාරය ඊට නිදසුන්.

අලුත්ම ව්‍යාපාරය ආරක්ෂක හමුදා දිරි ගැන්වීමට පැවැත්වෙන මානෙල් මල් ව්‍යාපාරය. කුමන සංවිධානය කවර අරමුණක් වෙනුවෙන් කලත් ඉන් සෙත සැදෙන්නෙ ව්‍යසනයට පත් අසරණ මිනිසුන්ට නම් අපි ඒකට එකඟයි. ආරක්ෂක හමුදා අතින් කාලයක් බැට කෑ දහස් ගණන් අය අතරින් සංක්‍රමණිකයා ද එක් අයෙක්. ඒත් පොදු අරමුණක් වෙනුවෙන් පෞද්ගලිකත්වය අමතක කරන්න මේ මො-

26 පිටට